# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1708/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 13/11/2024<br>පැය 1925 | | |

## මාධ්‍ය නිවේදනය

**01. මනුෂ්‍ය ඝාතනයක් -හබරාදුව පොලිස් වසම.**

2024.11.13 වන අද දින උදෑසන කාලයේදී හබරාදුව පොලිස් වසමේ මිහිරිපැන්න ප්‍රදේශයේ හෝටලයක් පිටුපස වෙරළ තීරයේ පුද්ගලයෙකු කපා කොටා ඝාතනය කර ඇති බවට හබරාදුව පොලිස් ස්ථානයට 119 මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ වෙලේකොරටුව, තල්පේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් ගාල්ල ගරු මහේස්ත්‍රාත්තුමා විසින් මහේස්ත්‍රාත් පරික්ෂණයක් පවත්වා පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා කරාපිටිය රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇත. සැකකරුවන් සම්බන්ධයෙන් අනාවරණය වී නොමැති අතර, හබරාදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. කොකේන් සමඟ විදේශ ජාතිකයෙකු අත්අඩංගුවට ගැනීම - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශය ගුවන් තොටුපල ඒකකය.**

2024.11.12 වන දින උදෑසන කාලයේ කටුනායක ගුවන් තොටුපල පැමිණීම පර්යන්තයේදී ගුවන්තොටුපල පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශයේ නිලධාරීන් විසින් තුර්කියේ ස්ථාන්බුල් සිට ගුවන් මගින් පැමිණි විදේශ ජාතිකයෙකු අත්අඩංගුවට ගෙන ඇත. මෙම සැකකරු මීගමුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු ඔහුගේ උදරයේ තුල තිබූ ගුලි 17 ක් පිට කර ඇති අතර, එහි **කොකෙන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 325 ක් තිබී ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 32 ක් වූ සියෙරා ලියොන් ජාතිකයෙකි.**

සැකකරුගේ උදරය තුල තිබී **තවත් මත්ද්‍රව්‍ය ගුලි 39 ක්** පිට කර ඇති අතර, ඒ අනුව මේ දක්වා **මත්ද්‍රව්‍ය ගුලි 56 ක්** පිට කර ඇත. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යාංශ වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - පුත්තලම පොලිස් වසම.

2024.11.13 වන අද දින අළුයම් කාලයේ පුත්තලම පොලිස් වසමේ පුත්තලම අනුරාධපුර මාර්ගයේ 06 කණුව ප්‍රදේශයේදී අනුරාධපුර දෙස සිට පුත්තලම දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට වේගය පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 38 ක් වූ තබ්බෝව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. පුත්තලම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**